# නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

# ඇබෑර්තු

## (ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනමින්)

නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි (SHIFT ව්‍යාපෘතිය) පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන්, පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුවේ.

### ව්‍යාපෘති ගණකාධිකාරී තනතුර (තනතුරු 01)

**වැටුප් කේතය** : PS4 වර්ගීකරණය 'A'

**ව්‍යාපෘති වර්ගීකරණය** : ඇමරිකන් ඩොලර් මිලියන 100 ට වැඩි හා ඇමරිකන් ඩොලර් මිලියන 250 ට අඩු

**සුදුසුකම් හා පළපුරුද්ද** :

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, අදාළ ක්ෂේත්‍රයේ, උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්,

හෝ

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්.

සමග

සුදුසුකම් ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.

හෝ

(2) රජයේ දීපව්‍යාප්ත සේවයේ III / II හෝ ඉහළ පංතිය නිලධාරියකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්,

සමග

III / II පංතිය තනතුරක අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.

### ජ්‍යෙෂ්ඨ සමාජ නිලධාරී තනතුර (තනතුරු 01)

**වැටුප් කේතය** : PS5

**ව්‍යාපෘති වර්ගීකරණය** : ඇමරිකන් ඩොලර් මිලියන 100 කට වැඩි හා ඇමරිකන් ඩොලර් මිලියන 250 ට අඩු

**සුදුසුකම් හා පළපුරුද්ද** :

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, අදාළ ක්ෂේත්‍රයේ, උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්,

හෝ

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්,

සහ

ජලය හා සනීපාරක්ෂක අංශයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද, යටිතල පහසුකම් ව්‍යාපෘතිවල ප්‍රජා ඒකරාශි කිරීමේ ක්‍රියාකාරකම්වල පළපුරුද්ද සහිත අයවලුන්හට ප්‍රමුඛතාව හිමිවේ.

**පොදු කොන්දේසි :**

**වයස් සීමාව :**

අයදුම්පත් භාර ගැනීම අවසන් කරනු ලබන දිනයේදී අවුරුදු 64 ට අඩුවිය යුතුය.

**සේවා නියමයන් හා කොන්දේසි :**

මෙම පත්වීම්, කොන්ත්‍රාත් පදනමින්, මූලිකව වසර එකක් සඳහා වන අතර, සතුටුදායක කාර්යසාධනය මත වාර්ෂිකව අලුත් කළ හැක. අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි අන්තර්ගත කොන්දේසි මෙම පත්වීම් සඳහා අදාළ වේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කාර්යසාධනය මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත් අයදුම්පත්, සියලුම අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග, ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත, 2021-02-24 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. රජයේ හා ආයතනික අංශයේ සේවය කරනු ලබන අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**(SHIFT ව්‍යාපෘතිය),**
**අංක 38, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.**

**දිනය : 2021-02-02**